WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**87 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Ord. Level) Examination, 2021(2022)

**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I, II**
தொடர்பாடலும் ஊடகக் கல்வியும் I, II
Communication and Media Studies I, II

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II

※ **පළමුවැනි** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක් ද** ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
※ **පළමුවැනි** ප්‍රශ්නයට ලකුණු **20**ක් හිමි වන අතර, අනෙකුත් සෑම ප්‍රශ්නයකට ම ලකුණු **10** බැගින් හිමි වේ.

**1.** ශ්‍රී ලංකාවේ ඓතිහාසික ස්ථාන නරඹමින් ඒ පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීමට හැකිවන ආකාරයට මෙවර වාර්ෂික අධ්‍යාපනික චාරිකාව සැළසුම් කරන බව ගුරුතුමා පැවසීය.

(i) ඓතිහාසික ශිලා ලේඛන අයත්වන සන්නිවේදන ස්වරූපය කුමක් ද?

(ii) නැරඹීමට අපේක්ෂා කරන ස්ථාන තෝරාගැනීමේදී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිළ වෙබ් අඩවිය ප්‍රයෝජනයට ගැනිණ. වෙබ් අඩවියක් පවත්වාගෙන යාමේ වාසි **දෙකක්** ලියන්න.

(iii) පුරාවිද්‍යා ස්ථානවල තොරතුරු ඇතුළත් පොත් පිංචක් ලබා දීමට සැළසුම් කළ අතර එය පරිගණක ආශ්‍රිත ප්‍රකාශනයක් (DTP) ලෙස නිර්මාණය කිරීමේ වාසි **දෙකක්** ලියන්න.

(iv) චාරිකාවට අදාළ තොරතුරු භුවමාරු කරගැනීම සඳහා දුරකථනය භාවිතයට ගැනීමේ දී දෙපාර්ශ්වය විසින් පිළිපැදිය යුතු ආචාරධර්ම **දෙකක්** සඳහන් කරන්න.

(v) විශේෂ අවස්ථා ඡායාරූපගත කිරීමේ අවශ්‍යතාව ගුරුතුමා අවධාරණය කළේ ය. ඡායාරූපයක් ගැනීමේ දී අනුගමනය කරන ප්‍රධාන පියවර **තුන** මොනවාද?

(vi) එම ඡායාරූප යොදාගනිමින් පුවත්පතකට ලිපියක් සම්පාදනය කිරීමට යෝජනා විය. නිශ්චල ඡායාරූප භාවිතයෙන් මුද්‍රිත මාධ්‍යයට ලැබෙන වාසි **දෙකක්** ඉදිරිපත් කරන්න.

(vii) ඓතිහාසික ස්ථාන පිළිබඳ තොරතුරු රැස්කිරීමේ දී භාවිත කළ හැකි ශිල්ප ක්‍රම **දෙකක්** නම් කරන්න.

(viii) චාරිකාව පිළිබඳව ප්‍රාදේශීය මාධ්‍යවේදියෙක් ප්‍රවෘත්ති සඳහා තොරතුරු වාර්තා කිරීමට අපේක්ෂා කරයි. කිසියම් සිදුවීමක ප්‍රවෘත්තිමය වටිනාකම තීරණය කිරීමෙහිලා බලපාන සාධක **දෙකක්** දක්වන්න.

(ix) පාසලේ උදෑසන ශ්‍රව්‍ය විකාශය සඳහා චාරිකාව පිළිබඳ වාර්තා වැඩසටහනක් ඉදිරිපත් කිරීමට සිසුන් පිරිසක් සූදානම් වූහ. එහි පිටපත රචනා කිරීමේ දී පෙර සූදානමට අදාළව අවධානය යොමුකළ යුතු කරුණු **දෙකක්** ලියන්න.

(x) පුරාවිද්‍යාත්මක ස්ථාන පිළිබඳ රූපවාහිනී වාර්තා වැඩසටහනක් නිර්මාණය කිරීමට ද යෝජනා විය. රූපවාහිනී වාර්තා වැඩසටහනක ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

WWW.OLEVELAPI.COM

**2.** "සමාජ අභියෝග ජයගැනීම සඳහා ජනතාවට සහාය වීමට ජනමාධ්‍ය මගින් ඉටුකරන කාර්යභාරය ප්‍රමාණවත් වේ / ප්‍රමාණවත් නොවේ." මැයෙන් පැවැත්වෙන විවාදයකට සහභාගී වීමට ඔබට අවස්ථාව ලැබී ඇත.

(i) විවාදය අයත්වන සන්නිවේදන වර්ගය නම් කරන්න.

(ii) සන්නිවේදනයේ මූලික කාර්ය **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න.

(iii) ජනසන්නිවේදනයේ ස්වභාවය මූලික කරුණු **තුනක්** ඇසුරෙන් කෙටියෙන් විස්තර කරන්න.

(iv) ග්‍රාහකයා විචාරශීලී වීමේ අවශ්‍යතාව කරුණු **හතරක්** ඔස්සේ පැහැදිලි කරන්න.

**3.** (i) මුද්‍රිත හා විද්‍යුත් යනුවෙන් ජනමාධ්‍ය වර්ග දෙකකි. එම දෙවර්ගයට අයත් එක් මාධ්‍යය බැගින් නම් කරන්න.

(ii) සත්ව සන්නිවේදනය මානව සන්නිවේදනයෙන් වෙනස් වේ. සත්ව විශේෂ **දෙකක්** සන්නිවේදනය සිදු කරන ආකාරය පිළිබඳ නිදසුන් දක්වන්න.

(iii) කාර්යාලයීය මාධ්‍ය ක්‍රියාවලිය තුළ විවිධ උපකරණ භාවිතයට ගැනේ. කාර්යාලයීය මාධ්‍ය උපකරණ ලෙස ගැනෙන මුද්‍රා / මුද්‍රා යන්ත්‍ර **තුනක** කාර්යභාරය පැහැදිලි කරන්න.

(iv) ජනමාධ්‍ය හා නව මාධ්‍ය අතර වෙනස්කම් රාශියකි. ප්‍රධාන ධාරාවේ ජනමාධ්‍ය හා නව මාධ්‍ය අතර වෙනස්කම් **හතරක්** සන්සන්දනාත්මකව විමර්ශනය කරන්න.

[හත්වැනි පිටුව බලන්න

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**4.** (i) ශ්‍රී ලංකාවේ ප්‍රකාශිත පළමු පුවත්පත කුමක් ද?

(ii) ප්‍රවෘත්ති වාර්තාවක් සහ නිර්මාණාත්මක රචනයක් අතර පවත්නා වෙනස්කම් **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

(iii) පුවත්පත් මාධ්‍ය තුළ මාණ්ඩලික සහ ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ගේ ක්‍රියාකාරිත්වය ප්‍රධාන කරුණු **තුනක්** ඇසුරින් පැහැදිලි කරන්න.

(iv) තෝරාගත් ජනමාධ්‍යයක් සංවර්ධනාත්මක චින්තනය සඳහා දායක වන ආකාරය පිළිබඳ පහත කරුණු හතර ඇසුරින් විශේෂාංග ලිපියක් සකස් කරන්න.

(අ) අභියෝගවලට මුහුණදීම

(ආ) වැඩ කිරීම සඳහා උනන්දු කරවීම

(ඉ) ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය

(ඊ) නිර්මාණ කෘති බිහිකිරීම

**5.** 'රූපවාහිනී මාධ්‍යය' මැයෙන් පැවරුමක් සකස් කිරීමේ කාර්ය ඔබට භාර වී තිබේ.

(i) රූපවාහිනී මාධ්‍ය ග්‍රාහකයා හැඳින්වීමට භාවිත කරන යෙදුම කුමක් ද?

(ii) සෙසු ජනමාධ්‍ය අතුරෙන් රූපවාහිනී මාධ්‍ය වෙනස් වන ආකාරය කරුණු **දෙකක්** ඔස්සේ කෙටියෙන් පැහැදිලි කරන්න.

(iii) රූපවාහිනී මාධ්‍ය තුළ තොරතුරු නිර්මාණාත්මකව ඉදිරිපත් කිරීම සඳහා යෝග්‍ය වන දෘශ්‍ය ප්‍රකාශන විධි **තුනක්** විමර්ශනය කරන්න.

(iv) පුළුල් ග්‍රාහක ක්ෂේත්‍රයක් වෙත තොරතුරු ඉදිරිපත් කිරීමේ දී රූපවාහිනී මාධ්‍යකරුවන්ගේ අවධානය යොමු විය යුතු ග්‍රාහක විවිධතා **හතරක්** පැහැදිලි කරන්න.

**6.** තරුණ සිනමාකරුවන් වන නීලා, අලී සහ මාලනීට සිනමා උලෙළක සංවිධාන කටයුතු භාර විය.

(i) චිත්‍රපට ප්‍රදර්ශනයට පෙර ඒ සඳහා ඔවුන් අවසර ගත යුතු ආයතනය නම් කරන්න.

(ii) 'සිනමා' පුවත්පතේ කතුවැකිය සිනමා උලෙළ සඳහා වෙන් විය. කතුවැකියක මූලික ලක්ෂණ **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න.

(iii) සිනමා උලෙලේ පූර්ව ප්‍රචාරක කටයුතු සඳහා භාවිත කළ හැකි ගුවන්විදුලි වැඩසටහන් ආකෘති **තුනක** ස්වභාවය පැහැදිලි කරන්න.

(iv) සිනමා උලෙලේ පිළිගැනීමේ කතාව නීලාට පැවරුණි. එය සාර්ථක කර ගැනීම සඳහා නීලා විසින් පිළිපැදිය යුතු වාචික සන්නිවේදන නිපුණතා **හතරක්** සාකච්ඡා කරන්න.

**7.** 'මාධ්‍ය සමාජයට මඟ පෙන්වයි.' යන්න මෙම වසරේ මාධ්‍ය උලෙලේ තේමා පාඨය යි.

(i) වර්තමානයේ විකාශය වන රූපවාහිනී ටෙලි නාට්‍ය බොහොමයක කතා තේමාව ගොඩනැගී ඇත්තේ කුමන සමාජ සංස්ථාව වටා ද?

(ii) බුද්ධිමය දේපල පනතේ 'කෘතිය' යන්නට අයත්වන නිර්මාණ වර්ග **හතරක්** නම් කරන්න.

(iii) පුවත්පතේ අන්තර්ගතය සමාජ ප්‍රගමනය සඳහා දායක කරගත හැකි ආකාරය පහත අංග ඇසුරෙන් කෙටියෙන් පහදන්න.

(අ) සංස්කාරක වැකිය

(ආ) කාටූන්

(ඉ) විශේෂාංග ලිපි

(iv) ගුවන්විදුලි පිටපතක් සම්පාදනය කිරීමේ දී පහත සාධක භාවිතයට ගැනීමේ වැදගත්කම උදාහරණ ඇසුරෙන් පැහැදිලි කරන්න.

(අ) සංගීතය

(ආ) ශබ්ද ප්‍රයෝග

(ඉ) තාක්ෂණික බස් වහර

(ඊ) භාෂාවේ විරාම ලක්ෂණ

* * *

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...